# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# 2026 නොවැම්බර් 01 සිට 10 දක්වා මොදා (Barramundi), කොස්සා (Grouper) සහ කටිල්ලා (Milkfish) මත්ස්‍ය ගොවිපොළවල් ඉලක්ක කරගනිමින් ඉන්දුනීසියාවේ පැවැත්වෙන අධ්‍යයන නියෝජිත පිරිස් චාරිකාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) සහ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව 2026 නොවැම්බර් 01 සිට 10 දක්වා මොදු (Barramundi), කොස්සා (Grouper) සහ කටිල්ලා (Milkfish) මත්ස්‍ය ගොවිපොළවල් ඉලක්ක කරගනිමින් ඉන්දුනීසියාව වෙත විදේශීය අධ්‍යයන නියෝජිත පිරිස් චාරිකාවක් සංවිධානය කරනු ලබයි.

මෙම චාරිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ ඉන්දුනීසියාවේ දැනට පවතින මත්ස්‍ය අභිජනනාගාර සහ වගා පහසුකම් නිරීක්ෂණය කිරීම සහ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හමුවී සාකච්ඡා කිරීමයි. තවද, සෘජු විදේශ ආයෝජන, තාක්ෂණ හුවමාරුව සහ නව ඒකාබද්ධ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම ද මෙහිදී යෝජනා කෙරේ.

**කා සඳහාද?**

මෙම ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන මත්ස්‍ය අභිජනනය කරන්නන් සහ දේශීය අපනයනකරුවන්ගෙන් මෙන්ම, විදේශීය ආයෝජන ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීමට අපේක්ෂිත විභව පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහභාගීත්ව පිරිවැය**

පවතින ප්‍රතිපාදනයන්ට යටත්ව, තෝරා ගනු ලබන සුළු හා මධ්‍යම පරිමාණ (SME) සමාගම් සඳහා ගුවන් ටිකට්පත් ගාස්තුවෙන් 25% ක මූල්‍ය ආධාරයක් EDB මගින් ලබා දෙනු ඇත. විශේෂඥ සේවා, ද්විභාෂා පරිවර්තක සේවා, ස්ථාන ගාස්තු සහ සහභාගී වන්නන්ගේ අභ්‍යන්තර ප්‍රවාහන වියදම් ද EDB මගින් දරනු ලැබේ. ඉතිරි ගුවන් ටිකට්පත් ගාස්තු සහ නවාතැන් පහසුකම් ඇතුළු අනෙකුත් සියලුම අදාළ වියදම් සහභාගී වන්නන් විසින් දරාගත යුතුය.

**අයදුම් කිරීම සහ තේරීම**

අයදුම්පත් EDB නිල වෙබ් අඩවිය වන www.srilankabusiness.com හි ("Announcements" කොටස යටතේ) ඇති නියමිත ආකෘති පත්‍රයට අනුව සකස් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "Outward Delegation to Indonesia" ලෙස සටහන් කර, 2026 සැප්තැම්බර් 10 වන දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "**අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්ම, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**" වෙත ලැබීමට සැලැස්විය යුතුය. වැඩසටහන සඳහා සුදුසු සහභාගී වන්නන් තෝරා ගැනීම සඳහා ලැයිස්තුගත කළ අයදුම්කරුවන් EDB මගින් පත්කරන ලද මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ඇත.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර යමුනා සුමනරත්න මෙනෙවිය අමතන්න: දුරකථන: 011-2300732, 011-2300705-11 (දිගුව: 388) විද්‍යුත් තැපැල: yamuna@edb.gov.lk

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**නො. 42, EDB/NDB කුළුන, නවම් මාවත, කොළඹ 02**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**